මගේ අංකය 4/ගුරුආ/2/330(III)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
'ගුරු ආයතන ශාඛාව',
ඉසුරුපාය, බත්තරමුල්ල.
1994 පෙබරවාරි මස 13 වැනි දින.

චක්‍රලේඛ අංක 94/03

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව (සති අන්ත) හදාරන ගුරු භවතුන් සඳහා අධ්‍යයන නිවාඩු දින අනුමත කිරීම

ඉහත කාරණය සම්බන්ධයෙන් ඔබ ඇමතූ මගේ අංක 4/ගුරුආ/2/හා /329 (II) හා 1992-07-31 දිනැති චක්‍රලේඛ ලිපියෙහි දෙවන (02) ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලද බව දන්වමි.

(02) එබැවින් මෙම පාඨමාලාව හදාරන සියලුම ගුරු භවතුන් සඳහා එම පාඨමාලාව පැවැත්වෙන සති අන්තවල පෙරදින වන සිකුරාදා හෝ පසුදින වන සඳුදා හෝ යන දෙකින් එක් දිනකට රාජකාරි නිවාඩු ලබා ගත හැකි වේ.

(03) මෙම රාජකාරි නිවාඩුව යථෝක්ත පාඨමාලාව හදාරනු ලබන උපාධිධාරී අභ්‍යාසලාභී ගුරු භවතුන්ටද ලබා දීමට කටයුතු කරන්න.

කරුණාකර මෙම සංශෝධනය ඔබ පළාතේ අදාළ සියලුම නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ද දැන්වීමට ක්‍රියා කරන්න.

එන්. වී. සෝ. කේ. වේරගොඩ
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ලේකම්

පිටපත්

1. සියළුම අංශ ප්‍රධානීන්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.
2. ලේකම්, අධ්‍යාපන සේවා මණ්ඩලය.
3. විගණකාධිපති.